# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,061 - 2018 මාර්තු මස 02 වැනි සිකුරාදා - 2018.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :** | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 42 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 මාර්තු මස 23 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මාර්තු මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

41 - B 81256 - 353 (2018/03)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) තෙවරප්පෙරුම අප්පුහාමිලාගේ දොන් විල්සන් දයානන්ද වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2008 පෙබරවාරි 10 දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/දොළු/63 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 507/33/1, දෙමෝදරවත්ත, උඩුදෙණිය, ගම්පොළ පදිංචි සවුන්දන හැන්නදිගේ ඉන්ද්‍රාවතී වෙත ප්‍රදානය කොට ගම්පොළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්.ඩී.ඕ.සී. 34/38 යටතේ 2008 මැයි 27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය 2018.03.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුකර පහළ පත්තුවේ වැවතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උඩුදෙණිය නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද ............ භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ................ දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි ................ විසින් සම්පාදිත අංක ................ දරන කට්ටි කැඩීමේ පිඹුරේ/රජයේ මිනින්දෝරු බී.ජී.ඒ.ඒ. ධනපාල විසින් සම්පාදිත අංක සී.එම්. 320111 දරන රේඛා සටහනේ අංක 1:147 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0991 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම:

*උතුරට* : කැබලි අංක 1:145 හා 1:134;
*නැගෙනහිරට* : කැබලි අංක 1:134 හා 1:148 ;
*දකුණට* : කැබලි අංක 1:148;
*බස්නාහිරට* : කැබලි අංක 1:146.

ටී. ඒ. ඩී. ඩබ්ලිව්. දයානන්ද,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
දොළුව.

2017 සැප්තැම්බර් මස 14 වැනි දින.

03-25

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වන වගන්තිය) සඳහා වූ නිවේදනයයි.**

උතුරුමැද පළාත් සභාවේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඊ. ආර්. තිලකරත්න වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982 වර්ෂයේ පෙබරවාරි මස දහවන දින ප්‍රදාන කර ඇති අංක අනු/ප්‍ර/326 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන විලච්චිය, දකුණ ඉවුර පදිංචි මැණික්පුර ගෙදර ජිනදාස වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ම. නු. ප./1/198 යටතේ 1982 මාර්තු මස 31 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.03.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ බටහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විලච්චිය කෝරළේ මහවිලච්චිය ජනපදය 2 බී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ විලච්චිය, දකුණ ඉවුර නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති අංක එෆ්.සී. පී. අ/3 දරන කට්ටි කැඩීමේ පිඹුරේ සර්වේ අංක 74 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 02, පර්චස් 08 විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම. ගොඩ ඉඩම.

*උතුරට* : කැබලි අංක 73;
*නැගෙනහිරට* : කරත්ත පාර (කැබලි අංක 44 න් කොටසක්);
*දකුණට* : කරත්ත පාර (කැබලි අංක 75 න් කොටසක්);
*බස්නාහිරට* : කැබලි අංක 72 න් කොටසක්.

ඊ. ආර්. තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
මහවිලච්චිය.

2018 ජනවාරි මස 10 වැනි දින.

03-119

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම- (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් එන්. එච්. ආර්. නිශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2012.03.20 දින ප්‍රදානය කර ඇති අංක අනු/තලාව/ප්‍ර/2006 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ජයසූරිය ආරච්චිගේ ඇල්පේනිස් වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ..... යටතේ ...... දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.04.04 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**උපලේඛනය**

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, දකුණු නුවරගම් පළාත (තලාව) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නුවරගම් කෝරලේ අංක 405- මොරගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මොරගොඩ නැමති ගමේ පිහිටා ඇත්තා වූ ද අනුරාධපුර ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරී භාරයේ ඇති අංක කැ. සි. 110162 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 66 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2054ක් විශාලත්වය ඇත්තාවූද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ගොඩ ඉඩම.

*උතුරට* : කැබලි අංක 72, 68 සහ 67;
*නැගෙනහිරට* : කැබලි අංක 67 සහ 63;
*දකුණට* : කැබලි අංක 63, 64, 65 සහ 74;
*බටහිරට* : කැබලි අංක 74 සහ 72.

එන්. එච්.ආර්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තලාව.

2018 ජනවාරි මස 04 වැන දින.

03-120

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.**

ඌව පළාත් සභාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ජී. ජී. එන්. ගුණරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ලංකාණ්ඩුව විසින් 1961 නොවැම්බර් මස 09 වැනි දින ප්‍රදානය කර ඇති අංක ආර් 6690 දරන දීමනා පත්‍රයේ හිමිකරු වන බණ්ඩාරවෙල, බිඳුණුවැව පදිංචි ප්‍රේමා වික්‍රමසිංහ වෙත ප්‍රදානය කොට බදුල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 22 යටතේ 1961 දෙසැම්බර් මස 12 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති එල්. ඩී. ඕ. 31 යටතේ 1968 දෙසැම්බර් මස 09 වැනි දින ලියාපදිංචි කර ඇති 2698 පැවරුම් ඔප්පුව මගින් දෙහිවල පදිංචි රූපා මාලතී සපරමාදු යන අය වෙත පවරා ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.02.14 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහපළාත කෝරළයේ බිඳුණුවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඇත්තලපිටිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ බදුල්ල දිස්ත්‍රික් මැනුම් අධිකාරී භාරයේ ඇති සර්වේයර් ජනරාල් විසින් සම්පාදිත අංක 6 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/අංක අ.ග.පි. 26 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 245 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 03, පර්චස් 38 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : ටී. පී. 256578 සහ ඇළ රක්ෂිතය
*නැගෙනහිරට හා දකුණට* : කැබලි අංක 387
*බටහිරට* : කැබලි අංක 387 හා ඇළ රක්ෂිතය

ජී. ජී. එන්. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරවෙල,

2017 දෙසැම්බර් මස 14 වැනි දින.

03-121

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/46860.
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් :- අනු 11/4/3 - 2/ආයතන/ගලෙන්/2015.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 164, ඉඵක්බඩයාගම ග්‍රාම නිලධාරි වසමේ ගෝමරන්කල්ල ගමේ බී.එස්.වී.පී. 1431 හි කැබලි අංක 98 දරන ප්‍රමාණයෙන් අක්කර 01 ක් වන බිම් කැබැල්ල ආගමික කටයුතු සඳහා මොහිදීන් ජුම්මා පල්ලියේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : ජනපද පාර රක්ෂිතය; |
| *නැගෙනහිරට* | : පාසල හා ජල ටැංකියට වෙන් කළ ඉඩම; |
| *දකුණට* | : ජනපද පාර රක්ෂිතය; |
| *බටහිරට* | : ජනපද පාර රක්ෂිතය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* :- අවුරුදු තිහයි. (30) (2017.09.25 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2017 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2 % කි.

*දඩ මුදල.*- අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම ආගමික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාද ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුදීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2017.09.25 දින සිට වසර පහක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කරගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* පත්‍රයේ පළ වන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2018 මාර්තු මස 02 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර, රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03 - 12

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018** | | | |
| මාර්තු | 2018.03.02 | සිකුරාදා | 2018.02.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.09 | සිකුරාදා | 2018.02.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.16 | සිකුරාදා | 2018.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.23 | සිකුරාදා | 2018.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.29 | බ්‍රහස්පතින්දා | 2018.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2018.04.06 | සිකුරාදා | 2018.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.04.12 | බ්‍රහස්පතින්දා | 2018.03.29 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2018.04.20 | සිකුරාදා | 2018.04.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.04.27 | සිකුරාදා | 2018.04.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| මැයි | 2018.05.04 | සිකුරාදා | 2018.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.11 | සිකුරාදා | 2018.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.18 | සිකුරාදා | 2018.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.25 | සිකුරාදා | 2018.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.